# නොතාරිස්වරුන් වෙත කරන දැනුම් දීමයි

## ප්‍රකාශිත භාර සම්බන්ධව භාරකරුවන් විසින් පවත්වාගෙන යා යුතු තොරතුරු

2018 අංක 06 දරණ භාර (සංශෝධන) පනත සහ 2019 ජනවාරි 28 දිනැති අංක 2108/10 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2019 භාර නියෝගයන්ට (ප්‍රකාශිත භාරවලට අදාළ තොරතුරු) අනුකූලව ප්‍රකාශිත භාරයක් ඇතිකිරීමේදී භාරකරුවන් විසින් පහත දක්වා ඇති තොරතුරු ලබා ගැනීම හා පවත්වාගෙන යාම කළ යුතු වේ. ඒ අනුව ප්‍රකාශිත භාර ලේඛනයක් ලියා සහතික කිරීමේදී එයට පහත තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ.

1) භාරයට අදාළ විස්තර
   - භාරයේ නම
   - භාරයේ ලිපිනය
   - භාරයේ අරමුණ
   - භාරයට අදාළ වන දිස්ත්‍රික්කය සහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය
2) භාර කතෘ, භාරකරුවන්, සම භාරකරුවන් පිළිබඳ විස්තර
   - නම
   - ලිපිනය
   - හැඳුනුම්පත් අංක
3) අර්ථලාභියා, අර්ථලාභීන්, අර්ථලාභී තැනැත්තන් පන්තිය
   - නම
   - ලිපිනය
   - හැඳුනුම්පත් අංක
4) ඉහත 2 හෝ 3 දක්වා නැති එහෙත් භාරයක් ඇති කිරීමට දායක වන අනෙකුත් පුද්ගලයන් (අනු නියෝජිතයන්, නෛතික නියෝජිතයන්, කළමනාකරුවන්, ආයෝජන උපදේශකයන්, බදු උපදේශකවරු, ගණකාධිකාරීවරුන්
5) නෛතික පුද්ගලයෙකුගේ අර්ථලාභය පිණිස භාරයක් පිහිටුවා ඇති විට එම භාරයේ අර්ථලාභී හිමිකරුවන් වූ ස්වාභාවික තැනැත්තන්

අදාළ භාරයේ භාරකරු විසින් එම තොරතුරු සෑම මාස තුනකට වරක් හැකි උපරිම ප්‍රමාණයෙන් සත්‍යායනය කර යාවත්කාලීන කළ යුතුය. එසේම යම් නිශ්චල හෝ චංචල දේපළක් සම්බන්ධයෙන් වන ප්‍රකාශිත භාරයක භාරකරු විසින් ඉහත කී අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් තොරතුරු, ලියාපදිංචි කිරීම සඳහා භාර ලේඛනයේ මුල් පිටපත සමඟ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතුය. මුල් පිටපත සමඟ දෙවන මුල් පිටපත ද (Counterpart Original) ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දීමට කටයුතු කළ යුතුය.

රෙජිස්ට්‍රාර් ජනරාල්

*වැඩිදුර තොරතුරු සඳහා විමසීම්,*

*සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (නොතාරිස් අංශය)*
*රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව*
*අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල*

*දුරකතන අංක - 0112 889024 / 0112 889496*